පන්විල ප්‍රාදේශීය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.5,088,656 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, පන්විල පොදු වැසිකිළියේ වියදම රු.449,998 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුර නැගුම ව්‍යාපෘතිය මඟින් සභාවට ලබා දී තිබුණු රු.171,344 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, හුළුගඟ පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.150,000 ක් වටිනා පොත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මාස දෙකක රු.246,400 ක මුද්දර ගාස්තුව පමණක් ගිණුම්ගත කර තිබුණු අතර, වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම හා ලැබිය යුතු මුද්දර ගාස්තුව ඇස්තමේන්තු පදනම මත හෝ ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 2ක එකතු වටිනාකම රු.10,053,921 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයකට අනුව වසර 1 - 5 ත් අතර, කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.670,192 ක් හා වසර 5කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.1,961,566 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.13,162,114 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1-5 ත් අතර කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂ එකතුව රු.857,093 ක් හා වසර 5 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.2,610,914 ක් විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
----------------------------------------------------
අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.1,771,446 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
----------------------------------------------------
පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 vii (ඊ) හා xxx උප වගන්තිය | රු.170,607 ක දැන්වීම් පුවරු ගාස්තු ආදායමක් අයකරගෙන නොතිබුණි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | වසර 5 කට වරක් තක්සේරුගත කඩ කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 10ජේදය | (i) බදුකරුවන් විසින් කඩ කාමර අතුරු බදු දී කුලිය වරින් වර සංශෝධනය කර සභාවට ගෙවන කුලී මුදලට වඩා සියයට 90 ක ලාභ ලබමින් කුලී ලබාගෙන තිබුණද සභාවට ගෙවිය යුතු මුදල් ගෙවා නොතිබුණි.<br><br>(ii) කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් බව හා ඒ සම්බන්ධ උපදෙස් දී තිබියදීත්, ඇටර්නි බලපත්‍ර මඟින් කඩ කාමර හිමියන් 5 දෙනෙකු විසින් කඩ කාමර වෙනත් පුද්ගලයන්ට විකුණා රු.820,000 ක මුදල් ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,219,513 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,857,120 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,362,393 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,362,393 ක වර්ධනයට ව්‍යාපාර ආයතනවල බදු වැඩිවීම හා රජයේ පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම මූලික වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය 1.5:1, 1.4:1 සහ 1:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය
------------------------

2.4.1 වරිපනම්
-----------

සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.351,561 ක් විය. එම ශේෂයට වර්ෂ 1 - 5 ත් අතර කාලයක් ඉක්මවූ රු.108,492 ක හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.36,443 ක ශේෂ ඇතුළත් විය.

2.4.2 වෙනත් ආදායම්

------------------

(අ) ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට හිඟහිටි ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු ශේෂය රු.288,050 ක් වූ අතර, එම ශේෂයට වර්ෂයක කාලයක් ඉක්මවූ රු.149,050 ක ශේෂ ඇතුළත් විය.

(ආ) අක්කර බදු

--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.52,225 ක් හා සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම රු.37,772 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ අයකර තිබුණේ පිළිවෙලින් රු.8,142 ක් හා රු.16,579 ක් පමණි. බිල් කිරීමෙන් හා හිඟයෙන් අයකිරීමේ ප්‍රතිශතය සියයට 15 ක් හා සියයට 43 ක් තරම් අඩු අගයක් විය.

(ඇ) ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.258,169ක් වූ අතර, එම ශේෂයට වර්ෂයක කාලයක් ඉක්මවූ රු.65,565ක ශේෂ ඇතුළත් විය.

(ඈ) කසල බදු

------------

සභා බල ප්‍රදේශයේ ඇති පෞද්ගලික ආයතන, හෝටල් සහ වෙළඳසැල් වලින් කසල බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.363,705 ක මුදලක් ලැබිය යුතුව තිබුණු අතර, ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ යන්ත්‍රෝපකරණ ඒකකයේ වාහන උපයෝගී කර ගනිමින් නව ආදායම් මාර්ග වලට එළඹීමට අයවැය මගින් යෝජනා වී තිබුණද, ආදායම් ඉපයීමක් සිදුවී නොතිබුණි.

(ආ) සභාව විසින් 2012 වර්ෂයේදී හුළුගඟ දියඇල්ල ආශ්‍රිතව ඉදිකර තිබුණු නැරඹුම් මැදිරිය හා පිවිසුම් මාර්ගය අඩක් නිමකර අතහැර දමා තිබුණි.

(ඇ) 2004 වර්ෂයේදී ඉදිකර තිබුණු මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලේ එක් මහලක් පමණක් ප්‍රයෝජනයට ගනිමින් තිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකර වසර 14 ක් ගතවී ඇතත්, ඉතිරි මහල් 3 සම්පූර්ණ කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු කඩ කාමර 30 ක් 2009 අප්‍රේල් 28 හා 2016 අගෝස්තු 23 දින තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවාගෙන තිබුණද, එම තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමෙන් සභාවට රු.1,658,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන ජල ව්‍යාපෘති 7 ක ව්‍යාපාරික ජල සැපයුම් 15 ක් හා ගෘහස්ථ සැපයුම් 398 ක් සඳහා ජල මනු සවි නොකර ව්‍යාපාරික ස්ථානයකින් මාසිකව රු.200 ක හා ගෘහස්ථ සැපයුම් වෙනුවෙන් රු.150 ක ස්ථාවර මාසික ගාස්තු අයකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,500,000 වැයකර ඉදිකර තිබුණු සතිපොළ ගොඩනැගිල්ල වැඩ අවසන් කර මාස 16 ක කාලයක් ගතවී තිබුණද නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) සංචාරකයින් සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා භූමිය අලංකරණය සඳහා රු.4,204,748 ක මුදලක් වැයකර තිබුණද, හාගල රජයේ වතුයාය සතු ඉඩම පවරා ගැනීමකින් තොරව මෙම ඉදිකිරීම සිදුකර තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

අනුමත සැලසුම් මත ඉදිකෙරෙන ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබා දිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 39 කින් 17 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් එක් අයදුම්පතක් සඳහා පමණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
------------------------------------------

ප්‍රාදේශීය සභාව සතු රු.525,000 ක් වටිනා යතුරුපැදි 2 ක් හා අත් ට්‍රැක්ටරයක් වසර 2-9ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණ අතර, ඉකුත් වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු වාහන 3 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 හා 2013 වර්ෂවල මධ්‍යම පළාත් වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත හුළුගහ දියඇල්ල නැරඹීමේ මැදිරිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීම සඳහා රු.1,190,406 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ශක්‍යතා අධ්‍යනයක් සිදුකර යෝග්‍යතාවය හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අසාර්ථක මට්ටමේ පැවතුණි. දිය ඇල්ල නැරඹීමට සුදුසු ආකාරයට නැරඹුම් මැදිරිය සැලසුම්කර ඉදිකර නොතිබුණු අතර, නැරඹුම් මැදිරියට පිවිසීමට සවිකර තිබුණු යකඩ අත්වැට ඇතැම් ස්ථානවලින් දිරාගොස් තිබුණු බව හා යකඩ අත්වැටේ මීටර 5 ක පමණ වූ ඉතිරි කොටස සකස්කර නොතිබුණු බව 2017 මාර්තු 07 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කර්මාන්තය අඩක් නිමකර වසර 4 ක් ඉක්මවා තිබුණද නිමකර ඵලදායී ආදායම් උත්පාදන කාර්යයක යොදවා නොතිබීමෙන් මේ වනවිට දරා තිබුණ මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී මහල් 4 කින් යුක්තව ඉදිකිරීමට සැලසුම් කර තිබූ ගොඩනැගිල්ලක පළමු අදියර සඳහා රු.2,069,000 ක් වැයකර තිබුණි. එක් මහලක් සම්පූර්ණ කර 2004 වර්ෂයේදී ආයුර්වේදය ස්ථාපිත කර තිබුණු අතර, වර්ෂ 14 ක් ගතවී ඇතත්, වර්ග අඩි 750 බැගින් වූ මහල් 3 ක් සම්පූර්ණ කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් නොකර ව්‍යාපෘති ඉටුකිරීමෙන් පසු මිනුම් වාර්තා හා කොන්ක්‍රීට් මිශ්‍රණයෙහි ශක්තිය පිළිබඳ (Hammer Test) පරීක්ෂණ වාර්තා ලබා නොගෙන රු.2,000,060 ක් ගෙවීම් කර තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

සභා බල ප්‍රදේශයේ හුළුගහ, මැල්කඩේ, තවලන්තැන්න, මඩුල්කැලේ හා මහපතන යන ප්‍රදේශවලින් දිනකට එකතුවන ටොන් 1 ක පමණ කසළ වලින් දිරන කසළ සතියකට දිනක් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දීම සිදුකර තිබූ අතර, නොදිරන කසල සභාවට අයත් හාතලේ මොරහෙල ඉඩම හා හුළුගහ සෙන්ජෝන්ස් හිල් ඉඩමට පරිසරයට හානිවන අයුරින් බැහැර කරමින් තිබුණි. මෙම ඉඩම් 2 කම අධික බෑවුම් සහිත වූ අතර, නොදිරන කසල බැහැර කිරීම පරිසර දූෂණයට මූලික හේතුවක් මෙන්ම නායයෑම් තත්වයන් වැනි ස්වභාවික අනතුරු සඳහා බලපා තිබුණි.

3.7 පාරිසරික ගැටළු

------------------

සහාව කසල බැහැර කරන හුළුගඟ සහ හාතලේ අධික බෑවුම් සහිත ස්ථාන දෙකක් වන අතර, ලෝක උරුම නකල්ස් රක්ෂිතය ආසන්නයේ ජෛව විවිධත්වයකින් හෙබි වැසි වනාන්තර ලෙස ප්‍රසිද්ධ මෙම භූමිවලට නිසි කළමනාකරණයකින් තොර කසල බැහැර කිරීම, පරිසර දූෂණය හා සුන්දරත්වය විනාශ කිරීම මෙන්ම ජල මාර්ග අපවිත්‍ර වීම, ටින් හා ප්ලාස්ටික් කොටස් තුළ වැසි ජලය රැස්වීමෙන් සෞඛ්‍ය ගැටළු වැඩිවීමේ අවධානමක් පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 38 ක් සඳහා වෙන්කල රු.1,597,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 14 ක් සඳහා ඇස්තමේන්තුගත රු.1,253,600 ක ආදායමෙන් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

--------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(ඊ) කොන්ත්‍රාත් පාලනය